# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2018

**8 ශ්‍රේණිය** **නාට්‍ය හා රංගකලාව - I**

**නම :** ................................................................................................................................

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **අංක 1 සිට 20 දක්වා සියළුම ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

1) නාට්‍යයක් ඉදිරිපත් කරන ආකාරය,
   1. රූපණය 2. ශෛලිය 3. අභිනය 4. අධ්‍යක්ෂණය

2) රූපණය යනුවෙන් අදහස් කරන්නේ,
   1. අනුකරණය 2. සමාරෝපය 3. රඟපෑම 4. ආරූඪවීම

3) නාට්‍යයක් නරඹන්නා,
   1. ප්‍රේක්ෂකයා 2. රසිකයා 3. පාඨකයා 4. ශ්‍රාවකයා

4) චරිතයකට පිවිසීම,
   1. අනුකරණයයි. 2. සමාරෝපයයි. 3. අනුරූපණයයි. 4. රූපණයයි.

5) ක්ෂණික නිරූපණයක විශේෂ ලක්ෂණය වන්නේ,
   1. නළු නිළියන් සමූහයක් විසින් ඉදිරිපත් කිරීමයි. 2. පිටපතකින් තොරව ඉදිරිපත් කිරීමයි.
   3. ආනුෂාංගික කලා භාවිත කිරීමයි. 4. කේවල රංගයක් සේ ඉදිරිපත් කිරීමයි.

6) අධි මානුෂ චරිතයක් වන්නේ,
   1. අමරගියා දිව්‍යලෝකෙ නාට්‍යයේ සුරංගනාවි 2. මාෂා හා වලහා නාට්‍යයේ වලහා
   3. පුංචි අපට දැන් තේරෙයි නාට්‍යයේ කුකුල්හාමි 4. තොප්පි වෙළෙන්දා නාට්‍යයේ වෙළෙන්දා

7) ජනකතා පැවත එන්නේ,
   1. ගුවන් විදුලියෙනි. 2. රූපවාහිනියෙනි.
   3. අන්තර්ජාලයෙනි. 4. කට වහරෙනි

8) රංග විධාන යනු,
   1. නාට්‍ය පිටපතේ වරහන් තුළ නළු නිළියන්ට දී ඇති උපදෙස්ය.
   2. නාට්‍ය පිළිබඳ ප්‍රේක්ෂකයන් දැනුවත් කිරීමය.
   3. රංග භූමි පරිපාලක විසින් නළු නිළියන්ට දෙනු ලබන උපදෙස්ය.
   4. ආනුෂංගික කලා ශිල්පීන්ට අධ්‍යක්ෂකවරයා දෙනු ලබන උපදෙස්ය.

9) හාස්‍යෝත්පාදක කථාවන්ට නිදසුන් වනුයේ,
   1. ඊසොප්ගේ කථාය 2. අන්දරේගේ කථාය
   3. ඓතිහාසික කථාය 4. ජන කථාය

10) තොප්පි වෙළෙන්දා,

1. ළමා නාට්‍යයකි. 2. යොවුන් නාට්‍යයකි.
3. වීදි නාට්‍යයකි. 4. ප්‍රජා නාට්‍යයකි.

■ **A කොටසට ගැළපෙන පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| A කොටස | B කොටස |
|---|---|
| 11) ශිථිලකරණ අභ්‍යාස | ★ කටහඬ අභ්‍යාස |
| 12) එළුවන් කෑම | ★ රංග ක්‍රියා |
| 13) නම් පොත | ★ සිරුර සැහැල්ලු කිරීම. |
| 14) ලේන්සු හැංගීම | ★ ආහාර්ය අභිනය |
| 15) ආනුෂංගික කලා | ★ ජන ක්‍රීඩා |

■ **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති වගන්ති හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

16) අභිරූපණයේ දී දෙබස් භාවිත නොකරයි. (     )

17) අමරගියා දිව්‍යලෝකේ සෝමලතා සුබසිංහ මහත්මියගේ නාට්‍යයකි. (     )

18) 'බුද්ධ ගජ්ජය' ඇම්. ඇල්. සිල්වා ගුරුමුහම්දිරම්තුමා විසින් රචිත ග්‍රන්ථයකි. (     )

19) කුකුල්හාමි පුංචි අපට දැන් තේරෙයි නාට්‍යයේ චරිතයකි. (     )

20) ටෙලි නාට්‍ය විද්‍යුත් මාධ්‍ය මගින් නිරූපිත නාට්‍ය ප්‍රභේදයකි. (     )

(1 - 20 = ලකුණු 20)

## නාට්‍ය හා රංගකලාව II පත්‍රය

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

**අනිවාර්යය ප්‍රශ්නය**

(1) කෑමට බොහොම පලතුරු ඇත තැනින් තැන
සැපතට නිතර හිතවෙයි ඒ රස බොජුන
ලොබකොට සතුන් නොමරනු මස් කෑම ගැන
සතහට දුකක් දී තම රැකෙනු ද යෙහෙන

සැපතට සිතා මත්පැන් විස බොනු කුමට
බීමට අපට පැන් ඇති මිහිපිට කුමට
වදයට දෙලොව පැමිණෙයි ඒ පව්කමට
ලොබකොට නොබොනු මත්පැන් කිසි කළ සැපට

i. මෙම පද්‍ය ඇතුලත් ග්‍රන්ථය කුමක් ද ?

ii. මෙහි සඳහන් සිරුරට හිතකර ආහාරයක් නම් කරන්න.

iii. තමාගේ සැපත සඳහා නොකළ යුතු හිංසකාරී ක්‍රියාව කුමක් ද ?

iv. පංචශීල ප්‍රතිපත්තියට පටහැනි පව් දෙකක් ලියන්න.

v. බීමට ඉතාමාත් යෝග්‍ය පානයක් ලෙස මෙහි දක්වා ඇත්තේ කුමක් ද ? (2 × 5 = ලකුණු 10)

(2) i. සතර අභිනය නම් කරන්න. (ලකුණු 2)

ii. ඉන් නාට්‍ය කලාවට පමණක් සුවිශේෂ වූ අභිනය කුමක් ද ? (ලකුණු 2)

iii. නළුවාගේ රංග කාර්යයට බැහැරින් එක් කරගන්නා කලා අංග තුනක් විස්තර කරන්න. (ලකුණු 6)

(3) i. රංග භූමිය යන්නෙන් හැඳින්වෙන්නේ කුමක් ද ? (ලකුණු 2)

ii. නූතන රංගභූමිය නම් කරන්න. (ලකුණු 2)

iii. එම රංගභූමියේ කල්පිත බෙදීම් රූප සටහනක් මගින් දක්වන්න. (ලකුණු 6)

(4) i. ජන කථාවක් ඇසුරෙන් නිර්මාණය වූ වේදිකා නාට්‍යයක නම ලියන්න. (ලකුණු 2)

ii. නාට්‍යයකට පෙර චිත්‍රපටයකට සුදුසු ඉතිහාසය කතා දෙකක් නම් කරන්න. (ලකුණු 2)

iii. ඉතිහාස කාථා ඇසුරෙන් නිර්මාණය වූ වේදිකා නාට්‍ය හා චිත්‍රපට ලැයිස්තුවක් පිළියෙළ කරන්න. (ලකුණු 6)